

# සරුංගලය

**ප්‍රේමවංශ දසනායක**

පෙර දිනයක ඔබ දෑතින්
නූලක අග ගැට ගසලා
උඩ අහසට පන්නා දැමූ
නිවට සරුංගලයකි මා

සුළඟ හමන ඒ මේ අත
එහා මෙහා විසිවෙනු මිස
මගෙ හිතුමතයට කිසි තැන
යන්නට මට ඉඩක් නොමැත

බිම හිඳගෙන නූල අදින
ඔබ පමණයි දැන ඉන්නේ
කොයිබකදැයි මා යන්නේ
නැත ඔබ එය පවසන්නේ

නූල අගින් නැටවිය හැකි
කිසිවක් නොදැනෙන නොහැඟෙන
අප්‍රාණික රූකඩයක්
විලසඳ ඔබ මා දකින්නෙ

බිමට කෑගසා
විමසූ හැම විට
මා ගෙන යන්නේ
කොයිබකදැයි ඔබ

සිනාසුනා මිස
උපහාසෙන් මෙන්
නැත එක වදනක්
පිටවුනි ඔබ මුව

අත වෙරගෙන හිත දැඩිකොට
මේ කෙළවර නූල රැගෙන
කඩාදමා බැමි සියල්ල
මා ගත සිත නිදහස් කර

ඔබට නොපෙනි අතුරුදන්ව
යලි කිසිදින හමු නොවන්න
ඈත එපිට හිස් අහසට
පලා යන්න සිතෙන නමුදු

ඉහත දින ඔබ
මහද තැවරූ
සෙනෙහසක මුදු
වෙඩරූ පිඬකින්

මොලොක් වී ඇත
මගේ හදවත
කඩා දමනට
නොහැක එය මට

අව්වට පින්නට
සීතළ සුළඟට
මා ගොදුරක් කොට
මේ උඩ අහසට

මා එව්වේ ඔබ
මොන සිතකින් දැයි
පමා නොකොට තව
කියනු මැනවි මට

# අම්මාගේ මැයි දින පණිවිඩය

ලක්ෂ්මන් කොඩිතුවක්කු

කොහෙවත්ම යන්නැතුව ගෙටවෙලා ඉඳින්
වෙඩි උණ්ඩ පිපිරෙන්නෙ අපෙ ඉහට උඩින්
කම්කරුවො වෙනුවෙන්ම අඬන මත් මතින්
රජ්වෙන්නෙ උන් ටිකයි අපේ කර වටින්

ගිනි කකා අපෙ පොතට ණයට දෙන මුදලාලි
හැමදාම පළවෙනිදා යනව ඔය පෙළපාලි
පිටරටට මගෙ රටින් ගෑනු දෙන ජයමාලි
කම්කරුවො වෙනුවෙන්ම මැයි මාසෙ මනමාලි

වැවයි දා ගැබයි දෙක දිය සිඳී ඉරී තැලිලා
පාට ගෑ කොඩි අරන් ගමේ උන් මග බැහැලා
දෑ කැත්තෙ මිට කැඩිලා තලෙත් දැන් මල කාලා
යල මහට දෙකටමත් කුඹුරු ටික වල් බැහැලා

පුච්චගෙන රොටි ටිකක් ගියා හීලය අරන්
පුංචා ගොයියා ආවා පන්සලේ දොර ඇරන්
ලොකු සාදු නැහැ කිව්වෙ හිතේ දුක තද කරන්
වැඩියාලු පෙළපාලි ගෝලයෝ ටික අරන්

රතු පාට බබලනා මැයි මලුත් පොඩි කරන්
වැඩ කරන මිනිසුන්ගේ දවස දැන් උන් අරන්
හෙට උපදිනා එකත් ලෝකෙටම ණය කරන්
ජය මඟුල් කනවා නිල් මොනර කොල විසි කරන්

හැරෙව්වට දහදියත් රවටමින් රං බින්දු
පාට පාටින් ඇන්ද පෝස්ටර මන බැන්දු
ගැයුවාට බෙර වයා මහ පාරෙ ගී සින්දු
අපෙ කඳුල උපදින්නෙ උණුසුමෙන් දුක කැන්දු

මෙතෙක් කල් මැරී මැරී ගත්ත නං දෙයක්
හොඳ හිතින් හුරුවමට පෙන්නපං මටත්
දවසකට කෑ ගහලා හැදෙන්නෑ රටක්
හෙට ඇවිත් ඉල්ලපං මගෙන් බත් කටක්




# අඩක් දුර

ප්‍රසාද් වීරසිංහ

**තුංග ගිරි සිකරයෙහි**
**අඩක් දුර නැගුන තැන**
**විසල් තැනි බිමක් වෙයි**
**හරිත පැහැයෙන් නිලන**

**වඩා වෙහෙසක් නැතිව**
**කඩාගෙන කනු පිණිස**
**අතේ දුර ඉදී ඇති**
**නොදත් නෙක පළවැල ය**

**බෑවුමෙහි අගට විත්**
**පහළ බැලූවොත් කෙළින්**
**අතැර ආ පෙදෙස් වෙයි**
**කාකි පැහැයෙන් දැවෙන**

**කුහුඹුවන් තරම් වෙන**
**මුහුණු හඳුනනු නොහෙන**
**මිනිස් හැඬ කඩිසර ව**
**පොළොව හා යුධ වදින**

**සිහිව පුංචි ම දවස්**
**පපුව හිරවෙන විටෙක**
**නොකෑ ගෙඩියක් දෙකක්**
**අත්හරිමි ඊදෙසට**

**බේරිලා මට මගෙන්**
**හදාගනු පිණිස හිත**
**කුඩා මිනිසුනි ඔතැන**
**ඔහොම්ම ම හිඳිනු මැන**



# වසන්ත කීපයක් පසුකළෙමි..

ඩොමිනික් චන්ද්‍රසාලි

ඉතින් ඉන්පසු
වසන්ත කීපයක් පසුකළෙමි
උයන් දොර ඉවුරේ
නළල් තලයට රැළි වැටුණි

රට්ටු හිනස්සන ගස් මත
වසරකට එක වරක් පමණක් පිපෙන
කුස්තුර මකා නැගුණු මල් වැසි
පසු දින උදෑසන
කිසිත් තුරු හිසක් මත නොතිබිණි

බතික් සරමක් ඇඳගෙන
ලෝකයේ මැවුම්කරු වූ
මහා හිරු පවා අවරගිර ළඟ ගරා වැටුණි

ඉතිහාස පොත්වල රජකතා නොවෙනස්ව,
හූනු සාස්තර ඉන්ටනෙට් එකෙන් බලන
කාලයට ඔබින වාට්ටු සංකීර්ණවල
ප්‍රේමයෙන් අතුර වුණ,
ප්‍රේමයට අධිපති දෙවියන් ද
බෙහෙත් පෝලිමේ තුණ්ඩු දෙන තැන පොරකමි

ඉතින් ඉන්පසු
වසන්ත කිහිපයක් පසුකළෙමි

ස්ත්‍රීවාදී රේන්ද සාප්පු ළඟ
පුරුෂවාදී බාර් ළඟ
ඉස්සර උන්නු ජෝඩු දෙකට කැඩී
එකිනෙකාගේ විත්ති කූඩු වී තිබුණි

දොරින් දොර අබ මිටක් සොයා ආ සුළඟට
හැඳි වස්ත්‍ර පවා ගැලවී යන තරම්
අපේ ඉපැරණි සටහන් මුණගැසුණි

ඉතින් ඊටත් පසු
වසන්ත කීපයක් පසුකළෙමි